Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
*All Rights Reserved*

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# අනාවරණ පරීක්ෂණය 2021

**8 ශ්‍රේණිය** **සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය පැය 02 යි**

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01, 02 හා 03 ප්‍රශ්නවල ඉරි ඇඳි පද සඳහා වඩාත් සමීප අර්ථය ගෙන දෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 නංගිගේ උපන් දිනය එන තෙක් මම "ඇඟිලි ගනිමින්" සිටියෙමි.

(i) ගණන් කිරීමට පුරුදු වෙමින් (ii) සතුටින් හා අපේක්ෂාවෙන්

(iii) ඇඟිලිවල හැඩ බලමින් (iv) කනස්සල්ලෙන්

02 පාසල ආරම්භ වන බව දැනගත් ගුරුතුමියගේ "**හිසේ මලක් පිපුණි**"

(i) ළමයි මල් වගේ යැයි සිතිවුණි. (ii) මල් සහිත කොණ්ඩ කටුවක් ගැනීමට සිතුණි.

(iii) මල් පොකුරක් රැගෙන යාමට සිතුණි. (iv) දැඩි සතුටට පත්වුණි.

03 මල්ලීගේ දඟකාරකම දුටු නඩරාජා මාමා "**එකා යකා වෙලා**" යැයි පැවසීය.

(i) නපුරු බව (ii) ඉතා පිරිසිදු බව

(iii) දැඩි ලෙස අකීකරු බව (iv) කාල වර්ණයෙන් යුතු බව

04 පහත සඳහන් පිළිතුරු අතුරින් සඤ්ඤක අක්ෂරයක් නොයෙදුණු පදයක් ඇති පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(i) සලඹයා, හඳයා, හඬ (ii) වඳුරා, ගඟ, කඹය

(iii) එළුවා, බාඳුරා, අඹ (iv) කඟවේනා, බඳ, හඳ

- **අංක 05 හා 06 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාස සහිත පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.**

05 (i) ගැහැණිය, ගෝසාව, නිශ්පාදනය (ii) කණිෂ්ඨ, ශීතකරණය, පුස්ථකාලය

(iii) ලේඛම්, විහාරස්තානය, දියුණුව (iv) පඨය, නවීකරණය, භාෂාව

06 (i) පුස්තකාලය, ආභරණ, ඡන්දය (ii) ශිෂ්‍යාචාරය, විශිෂ්ඨ, වදාළ

(iii) සමස්ථ, පරිගනකය, සඳකිරන (iv) අක්ශර, රක්ෂනය, බාදාව

- **අංක 07, 08, ප්‍රශ්නවල දී ඇති පද යුගල අතුරින් නොගැළපෙන පද යුගලය තෝරා යටින් ඉරක් අඳින්න.**

07 (i) නුබ - ගගන (ii) නුවන - ඥානය (iii) දෙරණ -මිහි (iv) පසමිතුරු - සතුරු

08 (i) සියපත - පද්ම (ii) කර - රශ්මිය (iii) රුවනාර - සිඳු (iv) නයන - ඉඳුවර

09 උක්ත නාමපද පමණක් යෙදී ඇති පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(i) සතෙක්, මිනිසුන්, ගංගාවෝ (ii) බැතිමතුන්, කෙල්ලක, නැවියෙක්

(iii) ඇත්තු, භික්ෂුවක්, ඔබ (iv) මැසිත්තක, මැණියන්, තෙරණුවෝ

10 ගැටය සහිත ඇලපිල්ල, දීර්ඝ පාපිල්ල, යංශය, ඇදය පිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) ගෞරවය, රෑන, ක්‍රමය, මල්ල (ii) ත්‍යාගය, කෘතිය, නූල, පත්‍රය

(iii) තෘණ, රූප, රෑළ, ත්‍යාගය (iv) මෘදු, රූප, ව්‍යංග, රෑළ

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

- **අංක 11, 12 ප්‍රශ්නවල නිවැරදි වාක්‍යය තෝරා යටින් ඉරක් අඳින්න.**

11 (i) ගුවන්යානා අහසේ පියාසර කරති. (ii) සොරු බඩු සොරා ගෙන පැන යති.

(iii) තෙරණුවන් දහම් දෙසති. (iv) නංගිලා ගී ගයමින් නටයි.

12 (i) සිසුහු පාසල කරා ගමන් කරති.

(ii) ගුරුවරුන් දරුවෝ යහමග යවති.

(iii) කෙවිලිය කෑම සොයා පියඹුවේය.

(iv) සත්තු පරිසරය අලංකාර කරයි.

13 ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, යන ක්‍රියා පද පිළිවෙළින් යෙදී ඇති පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(i) ගයමින්, ලැබේවා, යන්න (ii) ලබත්වා, නටනටා, යනු

(iii) දුවනු, ගයමින්, ලැබේවා (iv) ඉතිරේවා, ගයන්න, දුවමින්

14 නිවැරදිව අකාරාදී පිළිවෙළට වචන යෙදී ඇති පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) සුනිල්, අමල්, කමල් (ii) නිමාලි, නයනා, නුවනි

(iii) ඉඳුවර, ගයාන්, කමල් (iv) ඉෂානි, මයුරි, වරුණි

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

15 සිංහල අක්ෂර මාලාවේ ව්‍යඤ්ජනාක්ෂර ගණන කීයද?

(i) 48 කි (ii) 18 කි (iii) 50 කි (iv) 42 කි

16 යුගල පද පමණක් ඇති පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(i) රැවුම් ගෙරවුම්, තාඩනපීඩන, හඳිහූනියම් (ii) කල්යල්, කලබල, යලමහ

(iii) දරමිටි, කැඩුම් බිඳුම්, ඉඳහිට (iv) ගේදොර, තරාතිරම්, ඉඳහිට

17 පහත සඳහන් පද සඳහා තනි පද ලියන්න.

(i) ලීයෙන් තැනූ ..............................................................................................

(ii) බොහෝ කලක සිට පැවතෙන ..............................................................................................

18 පහත සඳහන් පදවල විරුද්ධාර්ථ පදය ලියන්න.

(i) උන්නතිය ..............................................................................................

(ii) අධම ..............................................................................................

19 පහත සඳහන් වාක්‍යය නිවැරදිව පද බෙදා තිත් ඉර මත නැවත ලියන්න.

එහි වටිනාකම රුපියල් එක් දහස්පන් සියයක් විය.

..............................................................................................................................................

20 පහත සඳහන් ප්‍රකාශය සඳහා සුදුසු විරාම ලක්ෂණ යොදන්න.

මාගේ විජිතයට අවසර නැතිව ඇතුළු වූ තා කවුද වහා පිළිතුරු දෙව

..............................................................................................................................................

( ලකුණු 2 x 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- **ප්‍රශ්න අංක 1, 2, හා 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01 පහත සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න

(i) පහත සඳහන් වචන යොදා අරුත් පැහැදිලි වන සේ වාක්‍ය දෙකක් නිර්මාණය කරන්න.

(අ) පහන (ආ) පහණ

(ii) රතු රෝසමල කෙටි කතාවේ රචකයා කවුද?

(iii) "බූරුවා" යන පදයෙහි "බූ" සහ "රු" අකුරුවල යෙදී ඇති පිල්ලම් සඳහන් කරන්න.

(අ) බූ - ................................... (ආ) රු - ..........................................

(iv) 'පතසන් අවරගිරි නැටියෙන් වැටෙන කල
විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල

ඉහත සඳහන් කවිය ඇතුළත් කෘතිය නම් කරන්න.

(v) පහත සඳහන් කවියෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

කරන කලට පව් මීරිය මී සේ
විඳින කලට දුක් දැඩි වෙයි ගිනි සේ (ලකුණු 2 × 5 = 10)

02 පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න.

(i) නිරෝගිමත් දිවියක් උදෙසා සෞඛ්‍යාරක්ෂිතව හැසිරෙමු.

(ii) අපේ ජාතික උරුමයන් සුරකිමු

(iii) දේශීය කෘෂිකර්මාන්ත නගා සිටවමු.

(iv) මා ගත කළ දිගු නිවාඩුව

(v) තාක්ෂණය හා අධ්‍යාපනය (ලකුණු 20)

03 ඔබ, පාසලේ විදුහල්පති යැයි සිතා, දීර්ඝ නිවාඩුව නිසා අපවිත්‍ර වී ඇති පාසල පිරිසිදු කිරීමේ ශ්‍රමදානයට දෙමව්පියන් කැඳවීම සඳහා යැවිය යුතු රාජකාරි ලිපිය ලියන්න.ශ්‍රමදානයට අවශ්‍ය උපකරණ රැගෙන එන ලෙස ද සඳහන් කරමින් පැවැත්වෙන දිනය හා වෙලාව ඔබට අභිමත පරිදි යොදන්න. (ලකුණු 10)

04 පහත සඳහන් ක්‍රියා පද සඳහා සුදුසු උක්ත පද යොදා එක් අර්ථවත් වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.

(i) ගැයුවාය (ii) කරති (iii) වන්නෙහි

(iv) ලැබූහ (v) නරඹන්නෙහු (ලකුණු 10)

**05** පහත සඳහන් ප්‍රකාශ කා විසින් කා හට කියන ලද්දේ ද යන්න සඳහන් කරන්න.

(i) "තමුන්නාන්සේ ඇයි මොකද මේ වෙව්ලනවා නේද?"

(ii) "නො සෑහෙන අශිෂ්ට බස් නොදොඩව වනචරය, අප වැන්නන් ඉදිරියෙහි"

(iii) "උඹ සල්ලි එහෙම නැති කර ගන්නව නෙවෙයි."

(iv) "ඔව්, ඔව්, මට මතකයි. ගිය අවුරුද්දෙත් අපට වෙදසීයා තෙල් ගෑවා"

(v) " මේක කාටත් පොරෝජන වෙන දෙයක්. හරිද?"

(ලකුණු 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

06 පහත A කොටසේ ඇති බහ්වර්ථ පදවලට අදාළ පද දෙක බැගින් B කොටසේ ලියන්න.

| A | | B |
|---|---|---|
| (i) | වත | |
| (ii) | දද | |
| (iii) | දිය | |
| (iv) | සක් | |
| (v) | තුරු | |

07 පහත සඳහන් ගීතය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

දකුණ නැගෙනහිර බටහිර උතුර ද
එක කොඩියේ සෙවණේ
එක මෑ දයක් වී මහ බලයක් වී
පෙරට ම යමු ලංකා - ලංකා

ඉපදුණු අප හට ලක් පොළොවේ
සුරු වීරුකම් උපතින් හුරු වේ
දක්වමු දස්කම් දස්කම් විස්කම්
විස්මවමින් මුළු ලෝ

වැටුණත් නැගිටිමු වැටි වැටි නැගිටිමු
නැගැ නැගැ යමු දියුණේ
බාධාවලට ද බාධා ගෙන දී
පෙරට මැ යමු ලංකා - ලංකා

කන්දට කෙන්දට කොන්දට හුරු වී
නන්වත් අත හුරු වී
විපත පවා සැපතට හරවලා
පෙරට මැ යමු ලංකා - ලංකා්

වීර විකුම් පෑ ආදි මුතුන් ගිය
පාර අපේ උරුමේ
නෑර ඔවුන් මග - සුර ලෙසින් වැද
පෙරට මැ යමු ලංකා

(i) මෙම ගීතයේ සඳහන් වන දිශාවන් නම් කරන්න.

(ii) උත්තම පුරුෂ බහුවචන වර්තමාන කාල ආඛ්‍යාතයක් මෙම ගීතයෙන් සොයා ලියන්න.

(iii) පසුපසට යන පදය සඳහා යෙදෙන විරුද්ධාර්ථ පදය ගීතයෙන් සොයා ලියන්න.

(iv) ලක් පොළොවේ ඉපදෙන අයහට උපතින් හුරු වූයේ මොනවාද?

(v) සුරුවිරුකම් යන පදයට වෙනත් පදයක් ලියන්න..

(ලකුණු 2 x 5 = 10)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com



## පිළිතුරු පත්‍රය - I කොටස

(01) (ii) (02) (iv) (03) (iii) (04) (iii) (05) (iv) (06) (i) (07) (ii) (08) (iv)

(09) (iii) (10) (iv) (11) (ii) (12) (i) (13) (ii) (14) (iv) (15) (iv) (16) (i)

(17) (අ) දූවමය (ආ) විරාගත (18) (අ) පරිහානිය /අවනතිය (ආ) උත්තම

(19) එහි වටිනාකම රුපියල් එක්දහස් පන්සියයක් විය.

(20) " මාගේ විජිතයට අවසර නැතිව ඇතුල් වූ තා කවුද? වහා පිළිතුරු දෙව."

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01 (i) (අ) දල්වන පහන (ආ) පාෂාණ යන අරුත් ලැබෙන සේ නිර්මාණය කළ වාක්‍ය සඳහා ලකුණු ලබා දෙන්න.

(ii) ගුණදාස අමරසේකර මහතා (iii) (අ) දීර්ඝ පාපිල්ල (ආ) කෙටි පාපිල්ල

(iv) සැලළිහිණි සන්දේශය (v) ඇඳින එපවි දුරලන උපදේසේ

නුඳුන මැනවි තුන් දොර අවකාසේ (ලකුණු 2 x 5 = 10)

02 සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න (ලකුණු 20)

03 සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න (ලකුණු 10)

04 නිවැරදිව වාක්‍ය සඳහා ලකුණු ලබා දෙන්න. (ලකුණු 10)

05 (i) පූර්ණක විසින් කාළ භීෂණට (ii) මනමේ කුමරු විසින් වැදි රජුට

(iii) ස්වාමි දුව විසින් පියසේනට (කොල්ලාට) (iv) මුනුපුරා විසින් සීයාට

(v) සාත්තරකාරයා විසින් එතනහාමි හා ඩිංගිරාළට (ලකුණු 2 x 5 = 10)

06 පෙළ පොතේ 102, 103 පිටු අනුව ලකුණු පිරිනමන්න. (ලකුණු 2 x 5 = 10)

07 (i) දකුණ, නැගෙනහිර, බටහිර, උතුර (ii) දක්වමු (iii) පෙරට

(iv) සුරු විරු කම් (v) ශූරකම් හා වීරකම් (ලකුණු 10 )